# ප්‍රස්ථාපිරුළු-1

1) පරංගියා කෝට්ටෙ ගියා වගෙයි

පහසු මගක් තිබියදී එය අපහසුවෙන් කිරීම

2) හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ

යම් කෙනෙකු හොඳ කෙනෙකු නරක කෙනෙකු වේද

කියා කුඩා කළ ගතිගුණ වලින් දැනගන්න පුළුවන්

3) හොරාගෙ අම්මගෙන් පේන ඇහුවා වගේ

වැරදි වසන් කරන අයගෙන්ම වැරැද්දක් ගැන ඇහුවා

වගේ

4) වක්කඩේ හකුරු හැංගුවා වගෙයි

ආරක්ෂාවට තැබූ දෙයක් විනාශ වීම

5) කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගෙයි

ළඟදී යම්කිසි වස්තුවක් ලැබී ඉතා ආඩම්බර වීම

6) ගහේ කටු උල් කරන්න ඕනැ නෑ

ළමයින්ට දෙමව්පියන්ගේ නරක ගති ඉබේ පුරුදු වේ

7) ආඩි හත්දෙනාගේ කැඳ හැලිය වගේ

යම් දෙයකට දෙයකට සම්බන්ධ වී ඇති සියළු දෙනාම

කපටි ලෝභ අය නිසා ඒ දෙය හරි හැටි සිදු නොවීම

8) පිස්සිගේ පලා මල්ල වගේ

යමක් ඉතා අවුල් සහගත ලෙස තිබීම

9) පනින රිලවුන්ට ඉනිමං තැබුවා වගෙයි

වැරදි කරන අයට වැරදි කිරීමට පහසුවන ලෙස

කටයුතු කිරීම

10) අඟේ ඉඳන් කන කනවා වගෙයි

මිතුරකු වගේ ළඟින් ඉඳන් හතුරුකම් කිරීම